# ස.ණ.ස. පුවත් කොළඹින්

2019 - මාර්තු - තුන්වන කලාපය

දායකත්වය රු 15/-



03 පිටුව.. **93 සැමරූ ඕවිටිගම සණස**
ජේ. සුජීවා පුෂ්පකාන්ති

04 පිටුව.. ලක්ෂ්මන් ගුණවර්ධන
**'කාන්තා අඩ සංචමු'**

04 පිටුව.. සුභ මොහොතින් **විවෘත වෙයි**
නන්දනි පුෂ්පකුමාරි - සභාපතිනි

04 පිටුව..
**වාර්ෂික චාරිකාව**
එච්. ගුනසීලි මාලනි පිරිස්


# ගනුදෙනු අධීක්ෂණය කිරීමත්, සමුපකාර සංවර්ධනය කිරීමත්, කාරක සභාවේ වගකීමකි.

**සමුපකාර ප්‍රසාදිනි සණස නායක ඩැනිසන් වීරසූරිය**

සමිතිවල ගනුදෙනු සම්බන්ධයෙන් මාසයකට වරක් නියැදි වශයෙන් පරීක්ෂාවට ලක් කිරීම අවශ්‍යම කාරණයක් වී ඇත. කිසිදු අධීක්ෂණයට ලක් නොවීම නිසා සමහර සේවකයින් මුදල් අවභාවිතාවන් කරමින් එය අක්‍රමිකතා දක්වාත්, මුදල් වංචාවන් දක්වාත් ක්‍රියාත්මක වී ඇති බව මා නිරීක්ෂණය කර ඇත. දෙපාර්තමේන්තුව වර්ෂයකට වරක් විගණනය කිරීම හැර හදිසි විමර්ශණයක් මෑත යුගයේම සිදු නොකරන අතර, විගණන කාලයන් තුල සිදුකර ඇති අවභාවිතාවන්, අක්‍රමිකතා හෝ වංචනික ක්‍රියා හෙළිදරව් නොවී ඇති බැවින් එම විගණනයන් කෙරෙහි ද විශ්වසයක් තැබිය නොහැකි බවට වූ උදාහරණ මට දිය හැකිය. ඒ නිසා මෙම සමිතිවල පැවැත්ම හා ගනුදෙනු වල ඇති විශ්වාසනීයත්වය තහවුරු කර ගැනීම දෙපාර්තමේන්තු වාර්තාවකින් හෝ අභ්‍යන්තර විගණන කමිටුවකින් ඉටු වේයයි නිගමනය නොකොට, වැරදි සිදු නොවීමට වගබලා ගැනීම කාරකසබාවේ වගකීමක් බවට පත්කර ගත යුතුවේ. දශකයකට වැඩි කාලයක් තුල මවිසින් හෙළිකරගත් මෙවැනි අක්‍රමිකතාවන් නිසා නියැදි වශයෙන් කාරක සභිකයින්ට එක් එක් කාරණා අධීක්ෂණය කළ යුතු ක්‍රම වේදයන් ගැන මගපෙන්වීම් කරමින් මාණ්ඩලික වාර්තාව හා කළමනාකරණ වාර්තාව කාරක සභාවේ අවධානයට ලක් කළ යුතුබවට කළක සිට දන්වා ඇතත් මෑත සිදු කළ සමීක්ෂණ වලින් පෙනී ගියේ සමිති බහුතරයක්ම එවැනි අධීක්ෂණයන් නොකරන බවය. මා පෙන්වා දී ඇත්තේ මාසයකට එක් කාරක සභිකයකු පැය 2 ක් පමණවත් සමිතිය වෙනුවෙන් කාලය යෙදවිය යුතු බවය. එසේ කළ නොහැකි නම් ඔවුහු කාරක කභිකයින් නොවිය යුතුවේ. ඉතාමත් අහිතතත්වය වන්නේ විගණයයටත් හෙළිනොවන අන්දමට ඉතා සූක්ම ලෙස සමිතියේ මුදල් අවභාවිතා කිරීම් සිදු කර අවසානයේ වංචාවන් බවට පත්වීමෙන් එකී සමිති කෙරෙහි විශ්වාසය පලුදුවීම එකී සමිතියට පමණක් නොව අන් සමිතිවලටත් බලපානා බවය.

මේ නිසා පෙබරවාරි මාසය තුළ දිනයන් වේලාවල් නියම කරමින් සියලුම සමිති නායකයින් කැදවා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් පවතින අතර, සෑම සමිතියක්ම ඒ පිළිබදව දැනුවත්වීම මේවන විටත් සිදුකරමින් පවතී. මේ සදහා සහභාගිවීමේ වැදගත්කම සලකා කාර්යාලයෙන් විමසා යොදා ඇති දිනවලින් හැකි දිනවලට පැමිණෙන ලෙස දන්වා සිටින අතර, පැමිණීමට නොහැකි වූවන් සදහා මාර්තු මාසයේ දී තවත් දිනයක් නියම කරනු ලබන බැවින් විමසාබලා දැනුවත් වීම යෝග්‍ය වේ. ,සණස සමිති අත්පොත, නමින් මෑතදී මවිසින් සම්පදනය කළ දිස්ත්‍රික් සංගමය නිකුත් කළ අත්පොත සෑම කාරක සභිකයකු හා සේවකයෙකු භාවිතා කළ යුතු බවත්, එහි මෙම අධීක්ෂණය පිලිබදව ඇතුළත්ව ඇති බවත් ඒ නිසා එකී කරුණ කියවා දැනුවත්වීම අවශ්‍යම වේ.

ඉදිරියේ දී මාස දෙකකටවරක් වත් විමර්ශයක් කළ යුතු බවට පෙනී යන අතර, ඉහත පරිදි අධීක්ෂණයන් කරමින්, එකී කටයුතු හා කළමනාකරණ කටයුතු වඩාත් ඉහල මට්ටමකට තබා ගැනීම සදහා සංගමයේ සේවාවන් ව්‍යාප්ත කිරීමට ද අප පියවර ගැනීමට අපේක්ෂා කරන්නේ සමිති සංවර්ධනය කිරීම සදහා දායකත්වයත් අදාළ පාර්ශ්වයන්ගෙන් නොලැබෙන බව අත්දකිමින් පවතින නිසාය. මේ සදහා ඉල්ලීමක් ඇති සමිති කෙරෙහි හා සංගමය ණය මුදාහරින සමිති කෙරෙහි ප්‍රමුඛතාවක් දැක්වීම ද අපේක්ෂිතය. සමුපකාරය ආරක්ෂාකර ගනිමින් ශක්තිමත් කිරීමේ වගකීමට උරදෙන කිසිවකු ක්‍රම ක්‍රමයෙන්

05 පිටුවට...

# රෝග පරීක්ෂා කිරීමේ සායනයක්

**පහත්ගමදී**



පහත්ගම සණස සමිතිය මගින් සමිතියේ සාමාජික සාමාජිකාවන්ගේ රුධිරය පරීක්ෂා කිරිමේ වැඩමුළුවක් පවත්වා තමන්ට ඇති රෝග පිළිබද දැනුවත් කිරීමේ සායනයක් සමිති කාර්යාලයේදී පසුගියදා පවත්වන ලදී.

දක්ෂ වෛද්‍යවරයෙකු සහභාගි වූ අතර මෙම වැඩසටහනේදී ප්‍රතිකාර ලබාගත යුතු ආකාරය සහ යහපත් දිවිපෙවතක් පවත්වා ගැනිමට අවශ්‍ය උපදෙස් ද ලබාදෙන ලදී.

**කේ.ඒ. පියතිලක - ගරු සභාපති, සී.ස. පහත්ගම සණස**

# වෑතර රිලාවල වාර්ෂික චාරිකාව




මෙවර සමිතියේ වාර්ෂික චාරිකාව පසුගියදා නුවරඑළිය අබේවෙල හයිලන්ඩ් කිරිපිටි කර්මාන්ත ශාලාව සහ මහනුවර, නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය නරඹන ලදී. මෙදින දිවා ආහාරය හා රාත්‍රි ආහාරය සමිතිය විසින් ලබාදෙන ලදී.

**වාර්තාව හා ඡායාරූප - එම්.රොහාන් ජේ. පෙරේරා**

# අපගේ අභිමානවත් 56 වන වසර සැමරීම

රාජගිරිය සිරිහඳ විද්‍යාලයේ දී රාජගිරිය නැගෙනහිර සණස සමිතියේ සංවත්සර මහ සභාව පසුගියදා උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. එය සදහා කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ සාමාන්‍යාධිකාරි තුසිත් වීරවර්ධන මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වු අතර පෙරවරු 9.00ට සංවත්සර සභාව ආරම්භ කර ආගමානුකූලව ආගම සිහිකිරීමෙන් පසුව චාරිත්‍රානුකූලව පොල්තෙල් පහන දැල්වීම සිදුකරන ලදී. එම අවස්ථාවට ආශිර්වාදාත්මක අනුශාසනාවක් සදහා අප ප්‍රදේශයේ ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ විහාරාධිපති දෙවුන්දර ධම්මරුචි ස්වාමින්වහන්සේගේ වැඩමවීම ද සිදුවිය. කැකුළු ළමා සමාජයේ පූජා නර්තනයෙන් සියලු දෙනා ප්‍රබෝධමත් වු අතර ඉන් පසුව සාමාන්‍යාධිකාරිතුමාගේ දේශනය ආරම්භ කරන ලදී.

අප සමිතිය කොළඹ දිස්ත්‍රික්කයේ ඉහල වර්ධනයකින් යුතු සමිතියක් බව කාර්යඑල වලින් පිට පිටම දෙවන ස්ථානයට පත්වීමෙන් සාක්ෂාත් වී ඇති බවත් මෙම ප්‍රදේශයේ අනෙක් 03 පිටුවට...






ජ්‍යේෂ්ඨ කලමණාකාරිනී ශ්‍රියානි කරුණාරත්න මිය වසර 25ක සේවා කාලය වෙනුවෙන් සමිතිය විසින් රන් පවුමකින් උපහාර දැක්වීම.



# ජලය

## ජීවිතය සේ දකිමු.

සරු දේ සරු ලෙසත්, නිසරු දේ නිසරු ලෙසත්, දකින යහපත් අදහස් ග්‍රහනය කරගන්නා සරු දේ ලබත් මෙම අදහස ධම්ම පදයේ යමක වග්ගයෙහි දොළොස් වන ගාථාවේ සදහන් වේ.

සෑම වසරක මාර්තු මස විසිදෙවනදා 'ලෝක ජල දිනය' ලෙස එක්සත් ජාතීන් විසින් පිළිගෙන, මිනිස් වර්ගයා විසින් සමරනු ලබත් මෙම සරල වදන්හී මතුපිට පෙනෙන අරුත ද සරලය. එහෙත්, අපි මදක් ගැඹුරට 'ජලය' ගැන විමසීමේදී ජිවන ආකෘතියට අත්‍යාවශ්‍ය වු ඛනිජමය වස්තුවක් සේ දකිමු.

ජලය, ජීවය හා පරිසිඳු බවක් ඇතිව එකට ගලා යන්නකි. ජලය ගැටෙන හැම දේම පිරිසිඳු තාවයකින් පවත්වා ගෙන ගියත්, ජලය රැඳෙන සෑම ස්ථානයක්ම පල් වෙමින් දුගඳ හමයි. මිනිසාගේ පැවැත්මට ජලය බීම අත්‍යාවශ්‍ය වේ. දිනකට ජලය පිරවු බෝතල හයක්වත් අවම වශයෙන් සිරුරට උරා දිය යුතුය. එසේ නොවිමෙන් විශේෂයෙන් වකුගඩුව නමින් හදුන්වන ඉන්ද්‍රයට හානි ඇතිවීමෙන් මිනිස් සිරුරට ආබාධයන් ඇතුල්වේ.

සිරිලක පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුවටත්, බටහිර කොලොම්තොට සිට නැගෙනහිර මඩකලපුවටත් පිහිටි භූමි ප්‍රදේශය පුරා ගලා යන ගංඟාවෝ මෙන්ම දියඇලි, සිරිලක දෙරණ මත, තෙරපීම්, දිගහැරීම් හා විසිරීම් සහිතව තෙරක් නොපෙනෙන මහ සයුර වෙත ගලා යන්නේ 'ජලය' නම් වු අසිරිමත් වස්තුවයි. පෙර රජ දවස ජලය එක බිඳුවකුදු සාගරයට යා නොදී වැව් අමුණු කරා හරවා ගෙන රදවා ගත්තේ, බීමට පමණක් නොව මනස්කාන්ත වු පරිසරයේ නිල්ල පවත්වා ගනිමින් වනස්පතිය ආරක්‍ෂා කොට ගොවි බිම් සරු කිරීමටය.

එහෙත් අද බීමට ගන්නා ජලය බඳුන් හී පුරවා මිනිස් පරිභෝජනයට වෙළඳපොලට යවමින් පවතී. ගඟ දිය ගලායන්නා සේ අපගේ දිවියද ඉදිරියට ගලායා යුතුය. මදක් ඔබ ඒ ගැන සිතුවාද? අප ජීවත් වන විශ්වයේ ප්‍රාණීන් උත්පාද වන්නේ කාබන් හා ජලය යන මුල පදාර්ථයන්ගෙන් බව උගෙන ඇත්තෙමු. දහමට අනුව නම් ආපෝ, තේජෝ, වායෝ, පඨවි නමින් සිව් මහ භූතයන්ගෙන් හඳුන්වති. ජලය නොමැතිව ජීවත්වීමට අපට හැකියාවක් නැත. එයයි දහම

සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිතියක සාමාජික වු ඔබ, ජලය ගැන මතුපිට දැක්මෙන් නිසල වීම යුතු නැත. ඔබ හා සමාජයේ ජීවත්වන්නන් ඔබව පිළිගැනීමක් කර ඇද්ද? එසේම ඔබව කී දෙනෙක් පිළිකෙව් කර ඇද්ද? ඔබගේ චර්යාවන් අනෙකුත් අයව පාරිශුද්ධත්වයට පත් කරත්නම්, සරුදේ සරුලෙස පිළිගැනේ. එසේම ජලය රැදී එක තැනම තිබීමෙන් පල්වී මැසි මදුරු උවදුරු ඇති කරමින් සමාජයපෙලන්නා සේ, ඔබත් ජීවන ගමනේ ප්‍රතික්ෂේප වු වෙක් නම්, පාරාජිතයෙකි.

එහෙයින් 'ජලය ලෝක ප්‍රජාව විසින් දිනයක් වෙන්කර සමරන මොහොතේ ඔබේ දිවියත් ගලායන පිරිසිඳු දිය දහරාවක් ව සමාජ ප්‍රගමනය කරා අත් වැලක් වන්න. 'ජලය' වචනයකට සීමා නොකොට ගැඹුරු දහමක් අපට පසක් කර දෙයි.


**ස.ණ.ස. පුවත් කොළඹින්**

π **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

π **ප්‍රකාශන කමිටුව**
කේ. ඩී. පතිරත්න
හේමසිරි බෙනරගම
සුනිල් අබේසුන්දර
එම්.රොහාන් ජේ. පෙරේරා

π **විධායක සහාය**
නාලක ජයසූරිය

π **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk


## සමූපකාර ණය ගණුදෙනු සමිති වල



# අරමුදල් කළමනාකරණය

මෑතක සිට බොහෝ සමුපකාර ණය ගණුදෙනු සමිති වල පවතින අතිරික්ත අරමුදල් ඵලදායීව කළමණාකරණය කිරීම පිළිබඳව විශාල ගැටළු පැන නැගී ඇත.

විශේෂයෙන්ම ප්‍රධාන කරුණු කිහිපයක් හේතුවෙන් මෙම අර්බුදයට ප්‍රාථමික සමිති මුහුණ දී ඇත.

1 ඵලදායීතාව අවම අය කර ගැනීමට නොහැකි ණය දීම් වලින් දිගින් දිගටම අලාභ සිදු වෙමින් පැවතීම.

2 වැඩි පොලියක් බලාපොරොත්තුවෙන් අධික අවදානමක් දරාගෙන සිදු කරනු ලබන විවිධ ආයෝජන

3 මූල්‍ය වත්කම් සංයුතියේ සමබරතාවය ගැන නොසලකමින් ඵලදායී ආදායම් නොයිපදවන ස්ථාවර වත්කම් ගොඩ නැංවීම.

4 මූල්‍ය ස්ථායිතාවය රැක ගැනීමට අවශ්‍ය මූලික මූල්‍ය කළමනාකරණ සංකල්ප පසෙකලා තීන්දු තීරණ ගැනීම. (උදා ඃ- වැඩි පොලියට තැන්පතු ලබා ගනිමින් අඩු පොලියට ණය ලබා දෙමින් ශුද්ධ ආන්තිකය සෘණ තත්වයට ගෙන ඒම)

5 විනිවිද භාවයට සහ වගවීමට පිටුපාමින් සිදු කරන ලබන වංචා හා දූෂණ අධික වීම.

මේ හේතු නිසා සියළුම සමුපකාරිකයින් විසින් සිය අරමුදල් කළමනාකරණය පිළිබඳව දැඩි අවධානයකින් කටයුතු කිරීම අනිවාර්ය වී තිබෙන කාලයක් උදා වී ඇත.

ලෝකයේ මුල් වරට සූක්ෂම මූල්‍ය ක්‍රමයන් ඇති වූයේ ගොවීන් මුල් කරගෙනය. එනම් 1864 දී ජර්මනියේ බිහි වූ 'රයිෆයිසෙස්' සමූපකාර ක්‍රමය තුලිනි. මෙහි දැක්ම වූයේ, 'ගොවීන්ට ඉතිරි කිරීම උගන්වමු' යන තේමා පාඨයයි. වර්තමාන සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති ක්‍රමයේ මූලාරම්භය සිදු වූයේ මෙම ක්‍රමයේ සාර්ථකත්වය සමඟිනි. පසුව මෙය සාමාජිකයින් විසින් පමණක් නොව කුඩා ප්‍රජා කණ්ඩායම් විසින් අනුගමනය කල අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස බංගලාදේශයේ ග්‍රාමීය බැංකු සංකල්පය සහ ඉන්දියාවේ සේවා වනිතා කණ්ඩායම් බිහිවීමට පටන් ගන්නා ලදී.

මෙම ඉතා හරවත් වූ ක්‍රමවේදය පරිහානියට පත්වීමට පටන් ගත්තේ විදේශ ආධාර මගින් එවැනි කුඩා කණ්ඩායම් වලට මුදල් ප්‍රදානය කිරීමට පටන් ගැනීමත් සමඟය. මීට හොඳම උදාහරණ බංගලාදේශයේ සහ ශ්‍රී ලංකාවේ ද දක්නට ලැබුණි. ශ්‍රී ලංකාවේ මිලියන නිවාස ක්‍රමය, ජනසවිය වැනි ව්‍යාපෘති තුලින් මුදල් ගලා යාමට සැලැස්වීම හේතුවෙන් ණය දෙන සමිති සහ ග්‍රාමීය බැංකු රැසක් පරිහානියට පත් විය. එනම් ඒවා තුල සිටි ජනතාවගේ සකසුරුවම සහ ව්‍යවසායකත්වය හැකියාවන් පරිහානියට පත් විය. මේ නිසා ඔවුන්ගේ අරමුදල් කළමනාකරණ හැකියාවන් ද ක්‍රමක් ක්‍රමයෙන් පරිහානියට පත්වීමට පටන් ගැණුනි.

<u>අරමුදල් කළමනාකරණයේ අරමුණ කුමක් ද?</u>

මෙහි මූලික අරමුණ වන්නේ සිය සාමාජිකයන්ගේ කොටස් මුදල් සහ අනෙකුත් තැන්පත්කරුවන්ගේ මුදල් වලට උපරිම ඵලදායීතාවයක් ලබා ගැනීමට හැකි වන අයුරින් ප්‍රාග්ධන මිශ්‍රණයක් සකස් කර සිය සමිතිය තුල කාර්යක්‍ෂම අරමුදල් ව්‍යුහයක් ගොඩ නංවා ගැනීමයි.

මේ සඳහා සැලසුම් සකස් කිරිමේදී සිය අරමුදල් වලට උපරිම වාසි ලබා ගැනීමට හැකි වන අයුරින් උපාය මාර්ග සකස් කිරීමට එම අරමුදල් පාලකයින් විසින් වගබලා ගත යුතුය. එවැනි උපාය මාර්ග සකස් කිරීමේදී බලපානු ලබන ප්‍රධාන සාධක තුනක් ඇත.

1 සමිතිය තුල සකස් කළ යුතු ප්‍රාග්ධන සංයුතිය

2 අවදානම දරණ අයගේ ප්‍රතිදාන වලට ගැලපෙන මූල්‍ය පිරිවැය හා ප්‍රතිලාභ

3 මූල්‍ය වෙළඳපොල තිබෙන අවදානම

**1 ග්‍රාමීය මූල්‍ය ආයතනයක ප්‍රාග්ධන සංයුතිය**

නීතියෙන් බිහි වූ සමූපකර මූල්‍ය ආයතනයක ඊට අදාල රෙගුලාසි වලින්ම ඒවායේ තිබිය යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් නියම කර ඇත. මෙහි සීමාව තීරණය කරනුයේ වෙළඳපොලේ පවතින පොලී ප්‍රතිශතය හෝ මූල්‍ය ප්‍රතිලාභ අවම වශයෙන්වත් ලබා දෙන පරිදි තිබිය යුතු ලාභදායීතාවය පදනම් කරගෙනය. එසේම මෙවැනි ග්‍රාමීය මූල්‍ය ආයතනයක සිදු විය හැකි අවදානම දරා ගැනීමට තරම් සෑහෙන ප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතු මූල්‍ය ධර්මයක් ද ඇත. මෙම මූලධර්මයේ අදහස වන්නේ මෙම මුදල් ස්වයං ප්‍රාග්ධනයක් මිස වෙනත් බාහිර වගකීමකින් සමන්විත මුදලක් නොවිය යුතු බවයි. ඔබට තේරුම් ගත හැකි ලෙස තවත් සරවල කියනවා නම් ඔබගේ සමිතිය තුල ණය දෙන උපරිම ප්‍රමාණයට ගැලපෙන පරිදි තිබිය යුතු ක්‍ෂණික ප්‍රාග්ධන ප්‍රමාණයයි. සාමාන්‍යයෙන් ග්‍රාමීය මූල්‍ය ආයතනයක් තුල මෙය ණය 10 කට ක්‍ෂණික ප්‍රාග්ධනය 1 ක් වත් තිබිය යුතු බවට පිලිගත් මතයයි.

අනෙක් පිළිගත් මූලධර්මය වන්නේ ද්‍රවශීලතාවය ආරක්‍ෂා කර ගැනීමයි. මින් අදහස් කරන්නේ මුදල් පිළිබඳව ඉල්ලුමට සරිලන පරිදි මුදල් පවත්වා ගැනීමයි. තවදුරටත් මෙය සරල කරයි නම්, තැන්පත් ගලා ඒමේ වගකීමට වඩා ණය ලබාදීමේ වත්කම ඉක්මවීමයි. මෙය සහතික කර ගැනීම සඳහා ඕනෑම අවස්ථාවක මුදල් කර ගැනීම පිණිස සෑහෙන වත්කම් ප්‍රමාණයක් පවත්වා ගෙන යා යුතුය. මෙහි මූලධර්මය වන්නේ දින 7 ක් තුල වගකීම් වලින් 20% ක් ලබා දිය හැකි වත්කමක් නිතරම පවත්වා ගත යුතු බවයි. ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සඳහා ග්‍රාමීය ණය දෙන සමිති නිතරම ණයදීම සඳහා උනන්දුවක් තිබිය යුතුය. නිතරම තමාගේ තිබූ ශේෂය ඉහල දැමිය යුතුය. (ඵලදායී ණය ශේෂය) නමුත් ග්‍රාමීය මූල්‍ය ආයතනයක් එක් ප්‍රදේශයකට පමණක් යොමුවීම මතත් වෙනත් සීමාකාරී සාධකයක් හේතුවෙන් මෙය සිතන තරම් පහසු කටයුත්තක් නොවේ. එනිසා දිස්ත්‍රික් සංගම් සහ ජාතික සංගම් වැනි ඉහල මට්ටමේ සංවිධාන ශක්තිමත් විය යුත්තේ මෙම කාර්ය වඩාත් ඵලදායීකව ඉටු කිරීම සඳහාය. ශ්‍රී ලංකාව තුල මෙම ක්‍රමවේදය බොහෝ කාලයක් ඉතා හොඳින් ක්‍රියාත්මක වුවත් මෑත කාලයේදී විවිධ සංවර්ධන බැංකු බිහිවීමත් සමඟ විවිධ අර්බුධකාරී තත්වයන්ට පත්වෙමින් පවතී.

ග්‍රාමීය සමූපකාර ණය දෙන ආයතනයක ප්‍රාග්ධන සංයුතියට බලපාන ප්‍රධාන සාධක පහත පරිදි පෙන්නුම් කළ හැකිය.

05 පිටුවට....

01 පිටුවෙන්....

## අපගේ අභිමානවත් 56 වන වසර සැමරීම



සමිති වලට අභියෝගයක් වෙමින් 56 වන වසර සැමරීම තුල ඇති අභිමානය අතිමහත් බවත් පැවසීය සංවත්සර වාර්තාව තමා පැමිණි පසු නිරීක්ෂණය කල බවත් තැන්පතු වල වර්ධනයක් ලෙස දක්වනවාට පෞද්ගලිකව තමා අකමැති බවත් ප්‍රකාශ කරන ලදී. තමා සහභාගී වු සමිති සංවත්සරයක හොදම ණයලාභියාට ත්‍යාගයක් ලබා දුන් අතර එසේ වීම එතරම් යහපත් කාරණාවක් ලෙස නොදකින බවත් අද දිනයේ මාතෘකාව ලෙස සණස ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණ වන සකසුරුවම පිලිබදව තමා සාමාජිකයින් දැනුවත් කිරීමට සුදානම් බව පවසමින් ආරාධිත දේශනයට මුල පුරන ලදී.

මීට මොහොතකට පෙර ස්වාමීන්වහන්සේ පැමිණ ආගමික වතාවත් වලින් ආරම්භ කලා සේම ඔහුගේ කථාව ද ආරම්භ කලේ සකසුරුවම පිලිබදව බුදුරජාණන්වහන්සේ දේශනාකල ගාථාවක් ඉදිරිපත් කරමිනි. මෙම ගාථාවේ අර්ථය වන උපයන ධනයෙන් කොටසක් ඉතිරි කර කොටසක් වියදම් කිරීමයි. එම අර්ථයම ඇති ගායන ශිල්පි අමරසිරි පීරිස් මහතාගේ ගීතයක් ද ඇති බවත් එහි පද පේලියන් ද සභාවට ඉදිරිපත් කලේය අපගේ ජීවිතයේ බොහෝ දේවල් අප සිදු කරන්නේ අපගේ සිත අනුව වන අතර දෛනික ජීවිතයේ ඉටුකරන වෙනත් දේවල් මෙන්ම සකසුරුවම ද පුරුද්දක් කර ගතයුතු බව ප්‍රකාශ කරන ලදී. තමා තුල ඇති හැකියාව මෙන්ම නොහැකියාව ද පුරුද්දක් කර ගැනීම තුලින් ධනාත්මක චින්තනය අප තුල ඇති කර ගත යුතු බව පැවසීය. මහමග යන විට ත්‍රීරෝද රථ වල දකින්නේම සෘනාත්මක වැකියන්ය. අප රට ද අප ඉගෙනගන්නා කාලයේ සිටම හදුන්වන්නේ ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙසය යන්න ද එම සිතුවිල්ලේම සිටියහොත් අනාගතයේ කීමට සිදු වන්නේ අප රට සංවර්ධනය කල නොහැකි රටක් බවත් පවසන ලදී.

සකසුරුවම ඇති කර ගැනීමට පලමුව සපුරා ගත යුතු කරුනු පහක් ඇති බවත් එම කරුනු එකිනෙක පිලිබදව දැනුවත් කරන ලදී. පලමු කරුණ නම් හොද පුරුදු ලගා කර ගැනීමයි එය සිදු කල යුත්තේ මේ මොහොතේ සිටය සමාජයේ නරක දේවල් වලින් බැහැර වී හොඳ පුරුදු ඇති කර ගැනීමෙන් ඉපයීම් වර්ධනය කර ගත යුතුයි. ව්‍යවසායකත්ව සංවර්ධනයක් තුලින් ඉපයීම් වර්ධනය කර ගැනීම පහසු වන අතර යැපීම් අඩුකර ගැනීම තුලින් සාර්ථකත්වයට ලඟා විය හැකියි.

දෙවන කරුණ නම් දරිද්‍රතා භීතිය නැති කර ගැනීමයි. මෙය ඉවත් කර ගත යුත්තේ අපගේ මනසින්ය. සෑම විටම තමා එම තත්වයේ සිටින බව නොසිතා එයින් ඉහලට පැමිණීම පිළිබදව සිතිය යුතුයි.

තෙවන කරුණ සෞභාග්‍යතා බහුලත්වය ඇති කර ගත යුතුය. ඒ සදහා තමන් ඉන්න ස්ථානය සෞභාග්‍යයෙන් පිරවිය යුතුය. එනම් ණයගැතියෙකු නොවීමයි වර්තමානයේ පුද්ගලයින් ණය වී ඇත්තේ අතීතයේ මෙන් පොතට නොව ස්මාර්ට් ලෙසයි එනම් ක්‍රෙඩිට් කාඩ් තුලින් ණය වි තම අවශ්‍යතා සපුරා ගනී මුදල් තබා ගත යුත්තේ තමාට අවශ්‍යම දේට පමණක් භාවිත කිරීමටයි. සමාජයේ කොතැන ගියත් ඇති නැති පරතරය පෙනෙන නමුත් මුදල් භාවිත කිරීම නිසියාකාරයෙන් සිදු කල යුතුය. තමාගේ අත ඇති මුදල් බැවින් ඩෙබිට් කාඩ්පත් වලින් අවශ්‍ය දේවල් ගැනීම ගැටලුවක් නැත.

සිව්වන කරුණ නම් සුරක්ෂිතතාවයයි තමාගේ අවිනිශ්චිතතාව ඕනෑම අවස්ථාවක විය හැකි බවත් එයට විසදුම ලෙස ලිස්සා යන මුදල් වලට වැට බැදිය යුතුයි.

අවසාන සංකල්පය එනම් පස්වන කරුන නම් ඉතිරිකිරීමයි. මෙම සංකල්ප ඇති කරගත් පුද්ගලයා සම්පූර්ණ අයෙක් වනබව ප්‍රකාශ කරමින් හරවත් දේශනය අවසන් කරන ලද අතර ඈත ගමක සණස සමිතියක සාමාජිකයෙක් මුලු සණසම එම පුද්ගලයාගේ ජීවිතය වු බවට සදහන් කවි පෙලක් ලියා තිබු අතර එම කවි පෙල තමාගේ සිත්ගත් බැවින් එය අපට ද ඉදිරිපත් කරන ලදි. තවදුරටත් එම කවියේ අවසන් කවිය වෙනස් කරමින් අප සමිතියට සුභ පතන ලදී.

ඉන් පසුව සාමාජිකත්වයේ පනස් වසරක් සම්පූර්ණ කල ගරු උපසභාපති ඩික්සන් අත්තනායක මහතාට ද සේවයේ විසිපස් වසරක් සම්පූර්ණ කල ජ්‍යේෂ්ඨ කළමණාකාරිණී ශ්‍රියාණි කරුණාරත්න මහත්මියට ද රනින් උපහාර දැක්වීමක් සාමාන්‍යාධිකාරතුමන් අතින් සිදු කරන ලදී. ඒ පිලිබදව ගරු සභාපති සුනිල් අබේසුන්දර මහතා ඇගයීමක් දක්වමින් කථා කල අතර විශේෂාංග වාරයේදී සාමාජිකා එම්.ඒ. ජයන්තා මහත්මිය ඔවුන් දෙදෙනාගේ උපහාරයට සුභ පතමින් කවි පෙළක් ඉදිරිපත් කරන ලදී. එමෙන්ම සමිතියේ සාමාජිකයින් දෙදෙනෙකු විසින් රසවත් ගී ගායනයන් තුලින් සභාව රසාස්වාදයට පත් කරන ලදී.

අවසානයේ කැකුලු ළමා සමාජයේ ළමයින්ගේ බටහිර ගීතයකට ඉදිරිපත් කල නර්තනයෙන් අනතුරුව සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**සුනිල් අබේසුන්දර සභාපති රාජගිරිය නැ. සණස**

# සිත දමනය කර ගැනීම

සිත දමනය කර ගැනීම, සිත පාලනය කර ගැනීම තුලින් අපේ ජිවිතය යහපත් කර ගැනීමට හැකි වන්නේ කෙසේදැයි මදක් සිතා බලමු. අපේ සිත ගමන් නොකරයි. අරමුණු පමණක් ගමන් කරයි. එය අපේ ශරීරයේ කොතන තිබෙනවාද කියා කීමට නොහැක. එම නිසා අරමුණු එක තැනක නවතින්නේද නැත. සුලඟ වගේ හැම තැනකටම රිංගයි. එම සිත තුල උපදින සිතිවිලි යහපත් හෝ අයහපත් විය හැකියි. ඒවා පෙරනයකින් පෙරා ගත යුතුයි.

සිත පාලනය තුලින් අපේ චර්යාරටා හසුරුවා ගැනීමට පුරුදු විය යුතුයි. සිතට වහලෙක් නොවී සදාචාරාත්මකව සිත සංවර්ධනය කර ගැනීම තුලින් එම පුද්ගලයාට තමාගේ නිවස තුලත් පරිසරය තුලත් යහපත්ව ජිවත්වීමට හැකිය. ගංගාවක් වුවත් මුලික පටන් ගැන්මේදී පිරිසිදුයි. නමුත් අතු ගංගා එකතු වු විට අපිරිසිදු වෙයි.

එම නිසා තම සිත දමනය කරගැනීම තුලින්, සිත පිරිසිදු කර ගැනීම තුලින් තමාට නිරෝගී ජීවිතයක් ගත කිරීමටද හැකි වනු ඇත.

**සන්ධ්‍යා ජයකොඩි**
**පිටිපන නගරය සණස**

## කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ
### මධ්‍යම කාන්තා කමිටුවට තේරී පත්වූ අධ්‍යක්ෂිකාවන්

| | | |
|---|---|---|
| ගරු සභාපතිතුමිය | : | ජයන්ති නවරත්න මෙනෙවිය<br>සී.ස. දකුණු ගොඩිගමුව |
| ගරු උපසභාපතිතුමිය | : | නිලානි ගුරුගේ මහත්මිය<br>කොට්ටාව දකුණ (මහරගම) |
| ගරු ලේකම් | : | ප්‍රේමලතා වණිගසේකර මහත්මිය<br>ගලවිලවත්ත උතුරු (හෝමාගම) |

| | |
|---|---|
| චන්ද්‍රානි සමරසිංහ මහත්මිය | (නැදිමාල) |
| කේ. දයා සිරිමති පෙරේරා | (වෑවල සණස) |
| ශ්‍රියානි දමයන්ති | (විශ්‍රාමික සණස) |
| ධම්මිකා කුමාරසිංහ | (බෞද්ධාලෝක මාවත) |
| ශ්‍රියාණි මාලා | (උඩුවාමුල්ල) |
| වජිරා කුමුදුනි | (වේරගල මාලිංගල) |
| එම්. නීතා සිරිවර්ධන | (ඉහළ හංවැල්ල) |
| සෙනෙහෙලතා විතානගේ | (වැලිවිට මාලබේ) |

**ප්‍රේමලතා වනිගසේකර - ගරු ලේකම්**

# 93 සැමරු ඕවිටිගම සණස

ඕවිටිගම සණස සමිතියේ 93 වන සංවත්සර මහ සභාව ඕවිටිගම සණස දේශන ශාලාවේදී පසුගියදා පවත්වනු ලැබිනි.

එදින 23 වන වසරටත් ඕවිටිගම සණස සමිතියේ සභාපති ලෙස උග්ගල්ලගේ ආනන්ද මහතා නිතරඟයෙන් පත් කරගන්නා ලදී.

මෙම සංවත්සර මහා සභාව සදහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුලස්ථාන පරීක්ෂක එච්.එම්.බී.එන්. හේවාවසම් මහතා සහ කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ගරු අධ්‍යක්ෂ ප්‍රසන්න ගීකියනගේ මහතා, සංගමයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තිලක් හත්වැල්ල සහ රත්නසිරි කොළඹගේ මහතාද මෙම අවස්ථාවට ආරාධිතයින් ලෙස සහභාගි විය.

**2019 වර්ෂය සදහා පත්වු නිලධාරි මඩුල්ල**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | උග්ගල්ලගේ ආනන්ද |
| **ගරු උපසභාපති** | : | විජේසේන සමරසිංහ |
| **ගරු කාරක සභික** | : | එච්. දයාලතා, එම්. හේමචන්ද්‍ර, එස්.එස්. විසිතා, තඹරි නදීෂානි, පත්මා අතුකෝරල, නයනා පුෂ්පකාන්ති, එච්.ජී. සුදර්ශනි |

**ජේ. සුජීවා පුෂ්පකාන්ති ජ්‍යෂ්ඨ කළමණාකාරිනී/ ලේකම්**

# පනාගොඩ මීගස්මුල්ල සණස
## සංවත්සර සැමරුම

කොළඹ දිස්ත්‍රික්කය හෝමාගම පර්ෂදය නියෝජනය වන පනාගොඩ මීගස්මුල්ල සණස සමිතියේ 24 වන සංවත්සරය පසුගියදා ඉතා උත්කර්ෂවත්ව පැවැත්වින.

1995 සාමාජිකයින් 15 දෙනෙකුගෙන් පටන්ගත් මෙම සණස සමිතිය අදවන විට ක්‍රියාකාරී සමාජිකයින් 400ක් සමන්විතයි. ඉතාමත් වේගයෙන් දියුණුව කරා යන මෙම සමිතියේ සභාපතිතුමා ඉතා කැපවීමෙන් සාමාජිකයින් හසුරුවමින් අප සණස සමිතිය දියුණුව කරා ගෙන යයි. තවද කාරක සභාව, ලේකම්තුමිය, භාණ්ඩාගාරික හා කළමනාකාරතුමියද එකසේ කැපවෙයි.

**ජී. වික්ටර් - පනාගොඩ සණස**

# 2019 නව වසරේ ප්‍රාර්තනා

| | |
|---|---|
| පුන් කලස නිහඩයි නිසලයි | නිබඳ |
| රන් රස පරිදි මිහිරියි සතුටුයි | නිබඳ |
| කැන්දන් යයි යසු ඉසුරු වෙත | නිබඳ |
| ලැබු වසර පුරා සතුට ඉතිරේවා | නිබඳ |

**ප්‍රේමලතා වණිගසේකර**
**හෝමාගම කලාපයේ අධ්‍යක්ෂිකා - මධ්‍යම කාන්තා කමිටුවේ ලේකම්**

# ස.ණ.ස.
පුවත් කොළඹින්




# ආයුර්වේදයට පිවිසෙමු

සී.ස. කොට්ටාව දකුණ කාන්තා සණස සමිතියේ කාන්තා කමිටුව මගින් සංවිධානය කරන ලද ආයුර්වේද වැඩ සටහනක් පසුගිය දිනක සමිති ශාලාවේදී පවත්වන ලදී.

එම වැඩ සටහන බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වෛද්‍යවරියන් තිදෙනෙක් විසින් ඉදිරිපත් කරනු ලැබීය.

බෝ නොවන රෝග කණ්ඩය දැනට ලංකාවේ කතාබහට ලක්වන මාතෘකාවක් බව හේමාලි වෛද්‍යවරිය විසින් පැවසීය. අධික රුධිර පීඩනය, හෘද රෝග, දියවැඩියාව, වකුගඩු රෝග, අධික තරබාරුව, අම්ල පිත්ත රෝග, මානසික රෝග හා පිළිකා රෝග මේ ගනයට වැටෙන බව පැවසීය.

මානසික අවපීඩනය අද දින වයස්ගතවූ ජනතාව ලක්වන තවත් එක් රෝගයක් බවත්, දෙමාපියන් හුදකලා ජීවිත ගතකරන අවස්ථාවන්හිදී මෙම තත්වයට මුහුණ දීමට සිදුවන බව පවසා සමිති සමාගම් වලට සහභාගිවීමෙන් ඔවුනොවුන් දැන හදුනාගෙන ආශ්‍රය කිරීමෙන් මෙම තත්වයෙන් වලක්වාගත හැකි බව පවසා සිටියාය. බස්නාහිර පලාතේ වකුගඩු රෝග බහුලවී ඇත්තේ පාලනය නොකළ දියවැඩියා හා නොයෙකුත් බෙහෙත් වර්ග පානය කිරීමෙන් බව සදහන් කර සිටියාය.

මාස 06 කට වරක් වෛද්‍යවරයෙකු වෙත ගොස් ඇස් පරීක්ෂාව, කොලොස්ට්‍රෝල් මට්ටම හා දියවැඩියාව හා රුධිර පරීක්ෂාව, වකුගඩු පරීක්ෂාව අවස්ථානුකූලව පරීක්ෂා කරගත යුතුය. වකුගඩු රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ රෝගය 4 වෙනි මට්ටමට අවස්ථාව වන විට බව පවසා දේශීය හෝ බටහිර බෙහෙත් අධික ලෙස වැඩි කාලයක් පාවිච්චි නොකරන ලෙසටත් ඉල්ලා සිටියාය.

මහරගම ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ අරමුණ වන්නේ ලෙඩවීමට පෙර උපදෙස් ලබාදී ප්‍රජාව දැනුවත් කර රෝග වලින් වලක්වාලීම බව වෛද්‍යවරිය වැඩිදුරටත් පවසා සිටියාය. ගෙදරින් පිලියෙල කරගත් ආහාර පාවිච්චියට ගන්නා ලෙසද පැවසීය.

බෝ නොවන රෝග වලට හේතු වැරදි ආහාර රටාව හා ව්‍යායාම ආදියේ නොයෙදීම හා ජානමය හේතුන්ද බලපාන බව පවසා විනාඩි 20ක් වත් ව්‍යායාම වල යෙදීමේ වැදගත්කම ගැනද වෛද්‍යවරිය පවසා සිටියාය. සීනි, පිෂ්ඨය අධික, ලුනු, තෙල් අධික ආහාර රටාවෙන් මිදෙන්න. තෙල් ඉවත් නොකර සතිගනන් තාච්චියේ ඇති ගැඹුරු තෙලෙන් බැදෙන ආහාර වර්ග ආහාරයට ගැනීමෙන් වලකින්න එතුමියගේ උපදේසය. වෙළඳ පොලෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී ඇසුරුම් වල ඇති 'ඊ' නොම්බරය ගැන දැනුවත් විය යුතු බව වෛද්‍ය ගුණතිලක මහත්මිය පවසා සිටියාය. ඊ අංක ගණන 40 වඩා වැඩි ආහාර වර්ග සුදුසු නැත. සොසේජස් කරලේ ඇති තැඹිලි වර්ණය ලබා ගැනීම සඳහා භාවිතා කරන තැඹිලි වර්ණකය පිළිකාකාරකය (ඊ 251) ඉන් වකුගඩු වලටද හානිදායකය. අධික සීනි පරිභෝජනයද ශරීරයට අහිතකරය. මිනිසෙකුට දිනකට අවශ්‍ය උපරිම තේ හැදි ප්‍රමාණය තේ හැදි 6කි. බත් වලද සීනි ඇත. පැනි බීම විදුරුවක සීනි හැදි 07ක් ඇත.

අඩු මිලට විකුණන ෆයිඩ් රයිස්ද ආහාරයට ගැනීම අහිතකරය. අප ගෙදරින් පිළියෙල කර ගන්නා ආහාර පරිභෝජනයට පුරුදු විය යුතුය. සමබර ආහාර වේලක් දරුවන්ට ලබාදෙන්න.

ඔබේ දින චරියාවට බ්‍රහ්ම මුර්තියෙන් උදැසන අවදිවී තේ, කෝපි බීම අතහැර, මද උණුසුම් වතුර වීදුරුවක් පානය කිරීමට පුරුදු වෙන්න. අතීතයේදී අපි කොළකැඳ ඔසුපැන් බීමට පුරුදු වුවද අද අපි තේ, කෝපි පානයට හුරුවීම ලෙඩ රෝග වලට අතවනා ඇත්තෙමු. රසවර්ග 6කේ ඇත. ඒ හැම රසයක්ම ලබා දෙන ආහාර ගැනීමට පුරුදු වෙන්න. රාත්‍රි ආහාරයට සැහැල්ලු ආහාරයක් ගන්න නින්දට පැය 2 ට පෙර රාත්‍රි ආහාර ලබාගන්න. එසේම කෙදි බහුල ආහාර ගැනීමෙන් අහාර ජීර්ණ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක වීමට උපකාරී වේ.

ඉහත දැක්වූ එම වෛද්‍යවරියන් සමිතියේ සාමාජිකාවන් හට ලබාදෙන උපදෙස්ය. එම උපදෙස් පිළිපැද නිරෝගී ජීවිතයක් ලබා ගැනීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමු.

**පී.ඩබ්.ආර්.සී. වඩුසිංහආරච්චි**
**වාර්තාකාරිනි**

# පහත්ගම වාර්ෂික වන්දනා චාරිකාව



පහත්ගම සමිතියේ වාර්ෂික වන්දනා චාරිකාව පසුගියදා අනුරාධපුර රුවන්වැලි මහා සෑයේ කප්රුක් පූජාව කේන්ද්‍ර කර ගනිමින් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ ද වන්දනා කරගැනීම සිදුකරන ලදී.



**කේ.ඒ. පියතිලක ගරු සභාපති**

# සුභ මොහොතින් විවෘත වෙයි

මලගල සමිතියේ මුලාරම්භය 1986 වර්ෂය තෙක් දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියා තිබුණමුත්, වර්ෂ ගණනාවක නිහැඩියාවකට පසුව සණස පාදුක්ක කලාප ලේකම් වන මාබුලගේ මහත්මිය විසින් 2016 අප්‍රේල් මාසයේ නැවත ආරම්භ කරන ලදී. දැනට වර්ෂ තුනක් පමණ වන සණස සමිතිය පසුගියදා සුභ මොහොතින් මාබුලගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් හා ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් සණස කාර්යාලය විවෘත කිරීමට හැකිවීම සතුටට කරුණකි.

**නන්දනි පුෂ්පකුමාරි - සභාපතිනි**

# සියඹලාගොඩ සණස වාර්ෂික චාරිකාව

අනුරාධපුර අටමස්ථානය වැදපුදා වවුනියා මඩුකන්ද දළදා විහාරයේ රාත්‍රි නවාතැන්ගෙන පසුදින, වෙල්ගම් වෙහෙර හා ත්‍රිකුණාමල අවට කෝකිලායාය පන්සල, සපුමල්ගස්කඩ, සේරුපතාන මාවඩුව විහාරස්ථාන වැදපුදා නිලාවේලි මුහුදුතීරයේ දියනා රාත්‍රිය ගතකිරීමට සණස කැම්පස් නිවාඩු නිකේතනයට පැමිණ එදින රාත්‍රියේ නැටුම්, ගැයුම්, වැයුම් සහිතව සුහද හමුවක් සියළු සාමාජිකයින් එක්ව සතුට බෙදා ගන්නා ලදී.

3 වන දින උණුවතුර ලිං සෙන්පති නන්දිමිත්‍ර පිලිරුව නරඹා කෝනේශ්වරම් විහාරභූමිය හා කෝනේශ්වරම් කෝවිල වැද පුදා කෝනේශ්වරම් මුහුදු තිරයේ දිය නා ගිමන්නිවා දඹුලු විහාරය වැද පුදා රාත්‍රි ආහාරය ගෙන ගම්බිම් කරා ලඟා විය. මෙම තෙදින චාරිකාව සදහා පිපෙන කැකුළු ළමා සමාජයේ ළමා සාමාජිකයින් හා සාමාජිකයින් 150 ක් පමන සහභාගි වු අතර එකමුතුභාවය සාමූහිකත්වය තුලින් දැනුම අවබෝධය නොඅඩුව ලබ ගැනිමට මෙම චාරිකාව ඉවහල් වු බව සතුටින් දන්වමි.

**එච්. ගුනසීලි මාලනි පිරිස්**
**පර්ෂද සභාපති**

# 'කාන්තා හඬ නංවමු'

පෙබරවාරි 14 දින මෑත කාලයේ කාටත් මතකයට එන දිනයක් විශේෂයෙන් නුතන තරුණ තරුණියන් අතරේ මේ දිනය ආදරවන්ත යන්ගේ දිනය ලෙස නම්කර තිබෙනවා. ආගමික නායකයකු වන ශුද්ධ වු වැලන්ටයින් ජියතුමා සමරන්නට එම දිනය වෙන්කර තිබෙනවා එහෙත් එයට දින 21 කට පසුව එන මාර්තු 08 වනදා දිනය ගැන කතා කරන්නේ කී දෙනාද. රටේ ජනගහනයෙන් වැඩිපිරිසක්වූ කාන්තාවන් වෙනුවෙන් වෙන්වු ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු අටවනදායි. නොයෙකුත් සමිති සමාගම් මගින් කාන්තා පෙළපාලි, වැඩමුළු, දැනුවත්කිරීම්, ප්‍රදර්ශන සංවිධානය කර ඇති මේ සියල්ල, ජනගහනයෙන් වැඩි කොටසක් නියෝජනය කරන කාන්තාවන් වෙනුවෙන්, දින 365න් එක් දිනයක් පමණක් ඇතිද? පසුගිය අවුරුද්දේ පෙළපාලියට රැගෙන ගිය 'කාන්තා දිනය සමරමු' බැනරය ගුලිකර තිබු මුල්ලෙන් එලියට ගෙන පවිත්‍ර කරන්නට කාලය ඇවිත්. එම බැනරය මේ වන විට මී ගුලක් වෙලා ඇති කෙසේ හෝ එය අරගෙන පිරිපහදු කර, මහරගම නගරය පුරා ඔසවා ගෙන යන්නට සිතනවා ඇති. වසරකට වරක් පමනක් කාන්තා දිනය වෙනුවෙන් හඬ නැංවීම පමණක් සුදුසු නොවේ. අපේ මව වෙනුවෙන්, අපේ සොහොයුරියන් වෙනුවෙන් වෙනදාට වඩා සැලකිල්ලක් දැක්විය යුතුමයි. ඔවුනගේ සැබෑ අවශ්‍යතාවයන්, අඩුපාඩු හදුනාගත යුතුයි. අපේ රටේ ශ්‍රම බලකායට එක්ව සිටින කාන්තාවනගේ 'දහඩිය කදුළු' මුතු කැටවලට හරවන්නට අපේ සමහර දේශපාලකයන් කෑමොර දීම පමනයි. කලේ. කාන්තා නියෝජනය කළ අතීතයේ වීරවරියන් අප සිහිපත් කල යුතුමය. හේමමාලී කුමරිය, සෝමා දේවිය, අනුලා බිසව, විහාර මහා දේවිය, ඇහැලේපොල කුමාරහාමි ඔබට මතක ඇති. එසේම එවරස්ට් නැග වාර්තාවක් පිහිටුවාලු කුරුඋතුම්පාල මහත්මිය අපේ රටට මහත් වු කීර්තියක් ගෙන දුන් අයෙකි.

එසේම කාන්තාවනගේ අගය හදුනා නොගත් ජඩ පිරිසක්ද සිටින බව කියන්නේ කණගාටුවෙනි. මත්කුඩු ව්‍යාපාරයන්ට සම්බන්ධ අය, ඝාතන, සොරකම් වලට එකතුවු කාන්තාවන්ද සැලකිය යුතු ප්‍රමාණයක් සිටිති. වඩාත්ම කණගාටු තත්වය වන්නේ මේ වන විට මරණීය දණ්ඩනය සදහා නියමවී කාන්තාවන් පිරිසක්ද සිටින බවයි.

**ලක්ෂ්මන් ගුණවර්ධන**
**පිටිපන නගරය සණස වාර්තාකරු**

# සභාපති ඩැනිසන් වීරසූරිය මහතාගේ පැහැදිලි කිරීමකි

2019 පෙබරවාරි කලාපයේ යු.ඩී.එස්.වීරසිංහ මහතා නමින් පළවී ඇති ,ග්‍රාමීය ආර්ථිකය ණය ගැතිභාවය සහ කාන්තා හිංසනය, යන හිසින් ලියා ඇති ලිපියෙහි පස්වන ඡේදයේ මා පිළිබදව කළ සදහන නිවැරදි කිරීම අවශ්‍ය වේ. එහි සදහන් කර ඇති ආයතන ඒකාබද්ධ කිරීමකට සැලසුම් නොතිබුණු බවත් කෙටුම්පත් කර තිබූ ක්ෂුද්‍ර මූල්‍ය පනතෙහි ඇතුලත් කර ඇති විධිවිධාන වලට සණස සමුපකාර සමිති යටත් වීමෙන් වෙන හානිය හා දුර්විපාක නිසා එම පනතට සමුපකාර සමිති ඇතුලත්වීමෙන් වළක්වා ගැනීමට කරණු දැක්වූ බව සදහන් කළ යුතුය. එය සමුපකාරය ආරක්ෂාකර ගැනීමට හේතුවිය. සමුපකාර සමිති සදහා පනත, රීතිය, අතුරු ව්‍යවස්ථාව, කාරක නියෝග තුළ පවතින්නේ නියාමනයන් නිසා යෝජිත පනත අධ්‍යයන කොට සමුපකාර රැක ගැනීම සදහා වූ විරෝධයක් බව දැනගැනීම අවශ්‍යවේ. හරි හැටි කරුණු නොදැන සටහන් කර ඇති බව සදහන් කරන අතර, පී.ඩී.ජයසුන්දර යනුවෙන් ලේකම්වරයෙකුද සිටියේ නැත.

**ඩැනිසන් වීරසූරිය.**

ස.ණ.ස.
පුවත් කොළඹින්

2019 මාර්තු කලාපය


01 පිටුවෙන්....

## ගනුදෙනු අධීක්ෂණය කිරීමත්,

නොමැතිවන බව සලකා අප විසින්ම රැක ගත යුතු වන හෙයින් ඒ සදහා දැනුමින් සන්නද්ධ වීමද අවශ්‍ය ය. අතීතයේ මෙන් දෙපාර්තමේන්තුව මගින් නිසි නිවැරදි නිතිමය උපදෙස් පවා නොලැබෙන, සමුපකාර භාවිතාවන් නැති විවිධසේවා සමිති කෙරෙහිම වැඩි අවධානයක් යොමු කර ඇති, නිලධාරීන්ගෙන් ලබන අත්දැකීම් ඵලරහිත නිසා සැබෑ සමුපකාරියයින් ලෙස භාවිතාවන් උපරිමයෙන් රැකගෙන මාසිකව මහා සභා රැස්වන සමුපකාර පවත්වා ගනිමින් සමිති සංවර්ධනය කරගනිමු. ඒ සදහා සංගමය පෙනී සිටී. සාමාජිකයින් විසින් එක්ව පිහිටුවා ලියාපදිංචිය දී ඇති සංගමයට මුදල් තැන්පත් කිරීමට අවසරයක් ගත යුතුයයි නියමයන් පනවන නිලධාරීන්ට කිව යුත්තේ සාමාජිකයා සිය සමිතියේ මුදල් තැන්පත් කිරීමට අවසර ගත යුතුනම් එවැනි සමිති පිහිටුවීමට අවසර නොදී ලියාපදිංචි නොකර සිටීම කළයුතු බවය. මෙවැන්නෝ සමුපකාර සමිති ආරක්ෂා කරන්නන් හෝ සංවර්ධනය කරනන්විය හැකි ද?

02 පිටුවෙන්.....

## සමූපකාර ණය ගණුදෙනු සමිති වල




ඉහත සාධක මුල් කර ගනිමින් නිරන්තර ප්‍රාග්ධන සංයුතියේ ස්ථාවර භාවය ඇති කිරීමට පාලනය විසින් වගබලා ගත යුතුය. ඉහත එක් කාරණයක් හෝ ගිලිහී ගියහොත් සිය ප්‍රාග්ධන අවදානමට ලක්වී ආයතනය දෙදරා යාම පුළුවන.

සාමාන්‍යයෙන්ඕනෑම සමූපකාර ණය ගණුදෙනු සමිතියක් පිලිගත් හා නීතිමය වශයෙන් පවතින ප්‍රාග්ධන සම්පාදන ක්‍රම වන්නේ,

1 කොටස් මුදල් 2 සාමාජික තැන්පත් 3 විධිමත් ආයෝජන සහතික 4 සංචිත 5 බාහිරින් ණයට ගත් මුදල්

වර්තමානයේ දක්නට ලැබෙන බොහෝ ග්‍රාමීය සමුපකාර සමිති වල සිය ප්‍රාග්ධන සංයුතිය තුල ඉතා වැඩියෙන් දක්නට ලැබෙන්නේ කෙටි කාලීන හෝ දිගු කාලීන ලෙස බාහිරින් ණයට ගත් මුදල්ය.

### 2 අවදානම දරණ අයගේ ප්‍රතිදාන වලට ගැලපෙන මූල්‍ය පිරිවැය හා ප්‍රතිලාභ

සාමාන්‍යයෙන් සමූපකාර ණය ගණුදෙනු සමිතියක සිය ප්‍රාග්ධනය සපයන සාමාජිකයාගේ කොටස්, තැන්පතු සහ ආයෝජන සඳහා ලබාදිය හැකි ප්‍රතිලාභය බැංකු පොලී ප්‍රමාණයට සමාන විය යුතුය. ඊට එහා ගෙවීම් ප්‍රතිපත්ති වලට එකඟ විය නොහැකිය. යම් කිසි කෙනෙක් එසේ නොකළහොත් සාමාජිකයා තැන්පත් නොකරයි කියනවා නම්, එතන සමූපකාරය හා සාර ප්‍රතිපත්ති නැත.

එසේම පිරිවැය අවම සහ ලෙහෙසියෙන් ලබා ගැනීමට හැකි ප්‍රාග්ධනය වෙනුවට ණය ගැනීම් වැඩි කළහොත් සමිතියේ ප්‍රාග්ධන පිරිවැය අධික වෙයි. එසේම ගණුදෙනු කිරීමේ පිරිවැය ද වැඩි වෙයි. මේ පිරිවැය වැඩි වුවත් ව්‍යාපාරික කටයුතු වලින් වැඩි අගයක් ලබයි නම් එහි වරදක් නැත. නමුත් බොහෝ ස්ථාන වල එසේ සිදු නොවේ. ක්‍රමවත් ණය ගෙවීම් ධාරාවකින් තොරව කල්පසු වූ ණය වැඩිවත්ම මෙම රටාව අනෙක් පැත්තට ගොස් සිය ශුද්ධ පොලි අතිරික්තයන් සෘණ මට්ටමට ලගා වෙයි. ද්‍රවශීලතාවයේ ගැටළු පටන්ගනු ලබන්නේ එතැන් සිටය.

මේ අනුව බලන කල සමිතියක යෝග්‍යතම ප්‍රාග්ධන සංයුතියක් ඇති කිරීම සඳහා හොඳ ප්‍රාග්ධන මිශ්‍රණයක් තිබිය යුතුය. එසේම ණය ගැනීම් හා ස්වයං ප්‍රාග්ධනය අතර සමබරතාවයක් ඇති කිරීම ඉතා කාලෝචිත සහ අත්‍යාවශ්‍ය කරුණකි.

### 3 මූල්‍ය වෙළඳපලේ අවදානම

සාමාන්‍යයෙන් මූල්‍ය වෙළඳපොල අවදානම සැමදාම ඒකාකාරීව පවතී. එසේ සිදු වන්නේ බාහිරින් ගන්නා මුදල් වලට වෙළඳපල ඇති ප්‍රතිශතයට වඩා පොලී ගෙවීමට සිදුවීමත් ඒවා ඉල්ලන විට ආපසු දීමට සිදුවීමත් නිසාය. එම නිසා හොඳ අභ්‍යන්තරික මුදල් සම්පාදනයක් ඇති සමිති වලට මෙම අවදානමෙන් වැලකී සිටිය හැකිය. එසේම විශාල තැන්පත්කරුවන්ට වඩා සුළු ප්‍රමාණයේ තැන්පත්කරුවන් විශාල දෙනෙක් සිටීම තුලින් අවදානම අවම වෙයි. ඉන් ද්‍රවශීලතාවයට හානියක් නොවීමට පුළුවන.

එසේම මෙම අවදානම නිසියාකාරව කළමනාකරණය කර ගැනීමට නම් සමූපකාර සමිතියකට ශක්තිමත් වත්කම් හා වගකීම් කළමනාකරණ ක්‍රමයක් තිබිය යුතුය. මේ සඳහා ද්‍රවශීලතා අනුපාතය ඉතාමත් වැදගත් දර්ශකයකි. මෙය පහත පරිදි ගණනය කළ හැකිය.

$$\text{ද්‍රවශීලතා අනුපාතය} = \frac{\text{අත ඉතිරි මුදල් කාලය තුල ක්‍ෂණිකව ගලා එන මුදල්}}{\text{කාලය තුල පිටතට ගලා යන මුදල්}}$$

$$\text{තවත් ක්‍රමයක් වන්නේ} = \frac{\text{සංසරණ වත්කම්}}{\text{සංසරණ වගකීම්}}$$

ඉහත කරුණු වලට අමතරව කාර්ය මණ්ඩල, පාලක මණ්ඩල සහ ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපාරික කටයුතු වලදී ඇති වන වංචා සහ දූෂණ තුලින් ද වෙළඳපොල අවදානමට මුහුණ දීමට සිදුවිය හැකිය. මේවා කළමනාකරණයේ සහ පරිපාලනයේ දෝෂ ලෙස පෙන්වා දිය හැකිය.

එසේම ඉතා අමාරුවෙන් සකස් කරගත් අභ්‍යන්තර ප්‍රාග්ධනය විවිධ ප්‍රතිදාන හා වරප්‍රසාද වලට නතුවීමෙන් බාහිර අවිධිමත් මූල්‍ය වෙළඳපල තුලට අත්පත් කර දීම තුලින් ද ප්‍රාග්ධන සංයුතිය අවදානමට ලක්විය හැකිය. සිය සාමාජික වගකීම් පසෙකලා සමූපකාර සාරධර්ම විනාශ කරමින් සිදු කරනු ලබන මෙවැනි දේ තුලින් ඇතිවී තිබෙන තත්වයට අද උදාහරණ ඕනෑතරම් තිබේ.

එසේ නම් මෙම අරමුදල් නිසි ලෙස යොදවා සිය සාමාජිකයාගේ ප්‍රතිලාභයන් දිනෙන් දිනදියුණු කිරීමට අප කුමක් කළ යුතුද ? වෙනකක් නොව, සිය සංවිධානයේ පාලන ක්‍රමය මූල්‍ය ගණුදෙනු වල නිරත සමිතියක ස්ථාවරතාවයට දැඩි ලෙස බලපාන්නකි. කාර්ය සාධන ප්‍රමිති මිණුම් හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. එසේම කාරක සභාව සහ සේවක මණ්ඩලය එය පිළිපදින බවට සහතික වීම අත්‍යාවශ්‍ය වෙයි. සාමාජිකයින්ගේ හා තැන්පත්කරුවන්ගේ මුදල් අයථා පරිහරණයෙන් විශාල කඩා වැටීමක් සිදු විය හැකිය. මෙවැනි සමූපකාර සමිති කිහිපයක් දැනටමත් අභාවයට ගොස් තිබේ.

පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී විය යුතු අතර, විනිවිද භාවයෙන් යුක්ත විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල වලට මූල්‍යමය උපාය මාර්ගානුබද්ධ හා කළමනාකරණ වගකීම් රාශියක් ඇත. මේවා අනු කමිටු හරහා ක්‍රියාත්මක කළ හැකිය. එවිට ප්‍රජාතන්ත්‍රවාදයත්, විනිවිද භාවයත් ඇති වෙයි. දේශපාලන අර්බුධ හා පරිවර්තන ද සූක්ෂම මූල්‍ය ආයතන වලට ඉතා අහිතකර ලෙස බලපායි. මෙම කාලයේදී ව්‍යවසායකයින්ට වෙළඳපොල ගැන දැනීම අඩු වන අතර, පුරෝකථන කිරීම ද දුෂ්කර කාර්යයකි. එම නිසා ප්‍රවේශමෙන් කටයුතු කරමු.

**තුසිත් කුමාර වීරවර්ධන**
**සාමාන්‍යාධිකාරී - සී.ස.කොළඹ දිස්ත්‍රික් සණස සංගමය.**

## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 අප්‍රේල් 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **විශ්වයේ ප්‍රාණීන් උත්පාදනය වන්නේ කුමන මූල පදාර්ථ එකතුවෙන්ද?**

## කුපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 01**

**සී.ස. හොන්නන්තර සණස සමිතියේ**
**පී.එම්. සෝමසීලි ප්‍රනාන්දු මිය**

## කුපන් අංකය 03

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................

..........................................................

පිළිතුර: ..........................................................

..........................................................

## නව වසරේ පිංකම් රැසක් සියඹලාගොඩ සණසින්

නව වසරේ ගණුදෙනු ආරම්භ කරමින් දින දසුනක් සමග ත්‍යාගයක් සාමාජිකයින්ට පිරිනැමීම

පසුගියදා පොල්ගස්ඕවිට පුරාණ විහාරස්ථානයේ පූජ්‍ය පාමංකඩ ඉන්ද්‍රජෝති නායක හිමිපාණන් වහන්සේගේ ජන්ම දිනය වෙනුවෙන් සිදුකරන වාර්ෂික කෘතවේදි දානමය පිංකම අටපිරිකර, සෙසු පිරිකර සහිතව ස්වාමින් වහන්සේලා 20 නමකට දහවල් දානය පිරිනමා සැමටම දිවා ආහාරය ලබාදීම.

වාර්ෂිකව සිදුකරන 96 වන පිංකම අටපිරිකර 50ක් සහ සෙසු පිරිකර සහිතව චෛත්‍ය පූජාව සියළුම සාමාජිකයින් හා ගම්වාසීන්ගේ සහභාගීත්වයෙන් අති උත්කර්ශවත් අන්දමින් සිදුකරන ලදී.



**එච්. ගුනසීලි මාලනි පීරිස් පර්ෂද සභාපති**

# ආදරවන්තයන්ගේ දිනය

## (වැලන්ටයින් දිනය)

පසුගිය පෙබරවාරි මස 14 වන දින, මෙන්ම, වාර්ෂිකව යෙදෙන ආදරවන්තයින්ගේ දිනය, වැලන්ටයින් දිනය වශයෙන් වානිජ ලෝකයේ සම්මතව ඇති වුවද, එහි සැබෑ අරුත හා ඊට පාදකවූ සන්සිද්ධිය නිවැරදිව හදුනාගෙන ඇද්ද යන්නට නැත යන්න යෙදුවහොත් නිවැරදි විය හැක.

නමුත් මේ දිනය පිළිබඳව, අතීතය හා ඓතිහාසික කරුණු විමර්ෂණය කිරීමේදි පෙනී යන්නේ, විශ්ව කීර්තිය ලත් පෙම්වතා වු ඉතාලි ජාතික රුඩොල්ෆ් වැලන්ටිනෝව පෙබරවාරි 14 වන දිනට කෙහෙත්ම සම්බන්ධයක් නොමැති බවත්, මානව හිතවාදි ආගමික පියතුමකු වු ශාන්ත වැලන්ටයින්ටද පෙබරවාරි 14 වන දින සම්බන්ධයක් නැති බවත්ය.

එවකට යුධ සමයේ රාජ්‍ය පාලනය මගින් තහනම් කර තිබු පරිදි, ආදරවන්තයින්ගේ විවාහයන් ලියාපදිංචිය, ඉතා අසාධාරණ නියමයක් බවත් ඒත්තු ගනිමින්, ඊට එරෙහිව ක්‍රියා කරමින්, එවකට ආදරවන්තයින් වශයෙන් සිටි අයගේ ඉල්ලීමට එකඟව, පල්ලිය මගින් ඔවුන්ගේ විවාහයන් ලියාපදිංචි කිරීමට වැලන්ටයින් පියතුමා කටයුතු කල නිසා, එම වරදට, එවකදි සිටි ක්ලොඩියස් රජතුමාගේ නියෝගයෙන් එම වැලන්ටයින් පියතුමාට මරණ දඩුවම ලබා දෙන්නට විය.

මෙම ශාන්ත වැලන්ටයින් පියතුමා, එවකට අග්‍රගණයේ මානව හිතවාදියෙකු වශයෙන් ක්‍රියාකර ඇති අතර, මෙම යුධ සමයේ විවාහයන් ලියාපදිංචි කිරීම නිසා, එතුමාගේ අභාවයෙන් පසුව, කෘතගුණ දත් බැතිමතුන්, එතුමාට ගෞරව දැක්වීමක් පුරුද්දක් වශයෙන් කරගෙන ගියත්, එය ආදරවන්තයින්ගේ දිනයක් නොවිය. ඊට හේතුව එම පියතුමා මානව හිතවාදියකු මිස, පෙම්වතෙක් නොවීමය.

එහෙත් වර්තමාන ලෝකයේ බොහෝ රටවල පවත්වනු ලබන, වැලන්ටයින් උත්සවය, බෙහෙවින් සුදුසු වන්නේ මුලු මහත් ලෝකයේම ආදරවන්තයින් අතරින්, උන්මත්තකාරාම ආදරවන්තයා වශයෙන් එවකදී සැලකු ඉතාලි ජාතික රුඩොල්ෆ් වැලන්ටිනෝ සැමරීම සදහාය.

මොහු ලාබාල අවධියේ සිය ජිවිතය ඉතා අමාරුවෙන් ගැට ගසාගෙන, පසුව විශ්ව කීර්තියට පත් පුද්ගලයෙක් බව කිව හැක. වාසනාව සොයා තම වයස 18 දී, ඉතාලියේ සිට ඇමෙරිකාවට සංක්‍රමනය වු රුඩොල්ෆ් වැලන්ටිනෝ එහිදී වැටුනේ සිටි තැනිනුත් පහල අඩියකටය. එසේ වුවත්, සුළු සුළු රැකියාවන්හි නිරත වෙමින් වගේම, සුළු සුළු සොරකම් කරමින් ජිවිකාව කරගත් මෙම තරුණයාට, වාසනාව පැදී ඇත්තේ චිත්‍රපට කර්මාන්තයට ඇතුළු වීමට මග පැදීමත් සමගය.

1921 දී 'මේරෝ' චිත්‍රපට සමාගම සදහා, ජුන් මෙතිස් නිපදවු 'ද ෂෝ හොස්මන් ඔෆ් ද ඇපොකලිප්සි' නම් චිත්‍රපටයේ, ජුලියෝගේ චරිතය රගපෑමෙන් ඔහු ලබා ගත්තේ සුවිසල් ජයග්‍රහණයකි. එවකට 26 වැනි වියේ සිටි මොහු ලබාගත් එම ප්‍රසිද්ධිය, ඔහු අවසන් හුස්ම හෙලු 1926 වසර දක්වාම, ජනතා සිත් සතන් තුළ රැදී සිටින්නට තරම් ඔහු දක්ෂ නළුවෙක් වී ඇත. ඔහු දක්ෂ නළුවකු පමණක් නොව, ජනප්‍රිය නළුවකුද වී සිට ඇත. එමෙන්ම, පැරමවුන්ට් ආයතනය නිපද වු 'ද ෂික්' චිත්‍රපටයේ රඟපෑමෙන්, වැලන්ටිනෝ ජාත්‍යන්තර මට්ටමේ නළුවෙක් ලෙස, විශ්ව කීර්තියට පත්වු අතර, එම චිත්‍රපටය, වර්ෂ දෙකක් තුළ ඩොලර් දස ලක්ෂ ගණනක් ආදායම් ඉපයීමට සමත් වී ඇත.

ඒ අනුව රුඩොල්ෆ් වැලන්ටිනෝ තරම් තරුණියන්ගේ සිත් ගත් නළුවෙක්, අද දක්වාම හමුවී නැතැයි පැවසීම අතිශෝක්තියක් නොවේ. පෞද්ගලිකව හමුවී පෙම් බැදීම් ඇති කරගත් තරුණියන් මෙන්ම, කිසිදින ඔහු සමග වචනයක්වත් කථා නොකල තරුණියන් දහස් ගණනක්ද, ඔහුට ආදරය කල බැව්, ඔහු ගැන ලියා ඇති චරිත කථා දෙකෙන් මෙන්ම, කාලීන පුවත් පත් වාර්තා පරීක්ෂණයෙන්ද කිව හැකිය.

තරුණියන් අතර, ජනප්‍රියත්වයේ ඉහළටම නැග සිටි ඔහුගේ විවාහ ජීවිතය අසාර්ථක වී ඇති අතර, එයට හේතු වුයේ සීමවකින් තොරව, පමණට වඩා රූමතියන් ප්‍රසිද්ධියේ ඇසුරු කල බැවිනි. ඔහු ජින් ඇකර් නැමැත්තිය සමග ප්‍රථම වරට විවාහ වී ඇති අතර, ඇයගෙන් දික්කසාද වීමට පෙර නතාවා රම්බෝවා නැමැති තරුණියක හා විවාහ නඩුවකට සම්බන්ධව සිර අඩස්සියේ සිටීමට පවා ඔහුට සිදුවී ඇත.

ඔහුගේම ප්‍රකාශනයකට අනුව, තමා එක් කාන්තාවකට පමණක් පෞද්ගලික අයිතිය ඇත්තකු විය යුතු නැතැයි සහ තමා, තමාට පෙම් කරන සියළුම තරුණියන්ගේ පෙම්වතා බවද සදහන් කර ඇත. මේ නිසාම ඔහුගේ අවමංගල්‍ය අවස්ථාවේදී උපහාර දැක්වීමට, තරුණියෝ සෝ ගී ගයමින්, දැඩි ලෙස වැලපෙමින්, අවසන් ගමන් මග දිගට පෙළ ගැසී සිටි බවට වාර්ථා වී ඇත. ඔහුගේ මිනී වලටද පැන දිවි නසා ගැනීමට තැත් කර ඇත.

වැලැන්ටිනෝගේ මළකඳ අවසන් අවස්ථාවේ තැණියන්ගෙන් ආරක්ෂා කර ගැනීම සදහා එදා අවමංගල උත්සවයේ ප්‍රදර්ශනයට තබා ඇත්තේ ඉටි වලින් සාදන ලද, අනුරුවක් බව, අදාල වාර්ථා වල සදහන් වේ. ඔහුගේ චරිතාපදානය ප්‍රථම වරට 1926 දි ලියා පලකර ඇත්තේ, ඔහුගේ දෙවන බිරිද වු නතාවා රම්බෝවා විසිනි.

'ද රියල් වැලැන්ටිනෝ' නමින් 1927 දී ජෝජ් උල්මාන් විසින්ද, පසුව 1962 දී රොබට් ඩබ්ලිව් රිසස්ට් විසින්ද, මෙම අසමසම ප්‍රේමවන්තයා පිළිබඳව, චරිපදාන ග්‍රන්ථ ලියා පල කර ඇත. ලොස් ඇන්ජලිස් හී පිහිටි ඔහුගේ සොහොන නැරඹීමටද, තරුණ තරුණියන් තවමත් යන බව සදහන් කරන්නේ නම්, ඔහුගේ පිළිගැනීමටය.

අද වෙළඳ ලෝකයේ ශ්‍රී ලංකාව ඇතුළු විවිධ රටවල, වැලන්ටයින් දිනයේ සිදු කරන කටයුතු වලින් පෙනී යන්නේ ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව, සමරන්නේ රුඩොල්ෆ් වැලන්ටිනෝ නැමැති පෙම්වතා බවයි. එසේ නොමැතිව, එදා රාජ්‍ය පාලනයෙන් තහනම් කර තිබු, ආදරවන්තයින්ගේ විවාහ, ලියාපදිංචි කිරීමට නිර්භයව කටයුතු කල මානව හිතවාදි වැලන්ටයින් පියතුමාට, ගෞරවයක් වශයෙන්, සමරන්නේ නම්, දැනට වඩා අර්ථවත් ලෙසින් සැමරීමට වගකිව යුත්තන්ගේ අවධානය යොමු කල යුතු බව නොකිවමනාය.

**පොතපත ඇසුරින්**
**ඩී.එම්. ප්‍රනාන්දු - වාද්දුව**

## ජාතක කතා පොතෙන්
# මච්ජුද්දාන ජාතකය

| | |
|---|---|
| බඹදත් රජු දවස බරණැස් | පුරවරයේ |
| බෝසත් කෙළඹියෙක් වී, එම ගම් | වරයේ |
| සොයුරෙක් සමග වාසය වෙති එක | කුටියේ |
| හැරයත් පියා, කඳුලක් දී හිටි | හැටියේ |
| පියතුම විසින් දෙන ලද මුදලක් | ණයට |
| සොයුරන් ගමන් ගති ණයකරුගේ | ගමට |
| දහසක කහවනුත් පොදි බැඳ එන | පෙරට |
| හමුවිය ගං තොටක්, පාරුව නැහැ | ගමට |
| කුසගිනි දැනී බත්මුල දෙදෙනා | කන්නේ |
| පිම්මෙනි මසුන් උඩ පැන හඬ දිය | පැන්නේ |
| ඇහුරුනි දිය බැස්ම පොරකන | පෙතියන්නේ |
| විසිරුනි බෝසතුන් බත් පිඩ මසු | කන්නේ |
| පිං දී නදී දෙවියන් හට අප | බෝසත් |
| විඩා නිවා වැල්ලේ වැතිරී සුව | පත් |
| බාල සොයුරු කළඹන කුහුලක | සිටියත් |
| ගල්කැට පොදිය බැඳ තැබුවේ නැත | වෙනසක් |
| ගඟ මැද යන අතර මසුරන් | විසිරෙන්නේ |
| සොර සිත කෑ ගසයි, නැහැ බෝසත් | දන්නේ |
| බාල සොයුරු ගෙට ගොස් පොදි | ලිහමින්නේ |
| ගල්කැට තිබේ, මසුරන් දිය යට | යන්නේ |
| ගඟ දිය මසකු මිලදී ගෙන අප | බෝසත් |
| පිළියෙල කරන විට හමුවේ ලොකු | පොදියත් |
| මසුනට ඉඳුල් පිඩ පෑමේ පින | ජලයත් |
| සොර සිත් සොයුරු හට වෙන්කලෙ හිමි | කොටසිත් |

*උපදේශය: දුෂ්ටයාගේ දේපල සුරක්ෂිත නොවේ.* *-සිරි-*

## වාර්ෂික චාරිකාව

නාවල මැද සමිතියේ වාර්ෂිකව සංවිධානය කරනු ලැබු චාරිකාව පසුගියදා සාමාජිකත්වය 105 දෙනෙකු පමණ සහභාගි වෙමින් අළුත්ගම කන්දේ විහාරය සහ ගාල්ල යටගල රජමහා විහාරය වන්දනා කරන ලදී. මාතර පොල්හේන මුහුදු තීරයේදී කුඩා ළමුන් ඇතුළු වැඩි පිරිසක් දිය නාමින් රිසිසේ විනෝද විය.

**එරන්දි මධුෂිකා**



# සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


කේ. පුෂ්පකුමාර


එච්.එම්.ජේ.ආරියසිරි


ආර්. හෙට්ටිආරච්චි


පී.ජී. ආරියවතී


එස්. ප්‍රනාන්දු


ලලිතා පෙරේරා


ඩබ්.එම්. ප්‍රනාන්දු


අජිත් ප්‍රේමලාල්


එල්. රාජකරුණා


එල්. ප්‍රියන්ති


මේරි ක්ලැරිස්


එල්. වීරරත්න


එස්. කොඩිකාර


සී. ශිරෝමාලා


දීපා ප්‍රියදර්ශනි

# උදාර වු ග්‍රාමයක පෙරලකුණ

# උතුරු කටුබැද්ද සණස සමිතිය

1995 මාර්තු 12 වන දින ආරම්භකල උතුරු කටුබැද්ද සණස සමිතිය 2019 මාර්තු මාසයට අවුරුදු 24ක් සම්පූර්ණ වන අතර මෙම මාර්තු මස 03 වන ඉරුදින 289 මහ සභාව 23 සංවත්සරයට පිය නගමින් අප ආ මග කෙටියි, යා යුතු මග දුරයි නිරතුරුවම නුවණැසින් තරණය කලයුතු බව උතුරු කටුබැද්ද සණස සමිතියේ නිලධාරින්ගේ වගකීමයි.

උතුරු කටුබැද්ද සණස සමිතියේ බල ප්‍රදේශයේ තොරතුරු වලින් බිදක් බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ග්‍රාම කොට්ඨාශ 42න් එක් කොට්ඨාශයක් වන 551 කටුබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාශය මෙය උතුරින් රාහුල පාරට දකුණින් බණ්ඩාරනායක මාවත නැගෙනහිරින් වේරස් ගඟට බස්නාහිරෙන් ගාළු පාරට මායිම්ව පවතින ප්‍රදේශය බණ්ඩාරනායක මාවතේ සිට වක්‍ර හැඩයකින් වේරස් ගඟ තෙක් පහත් බිමක් සහ ඇවිදින මන්තීරුවක් ඇති අතර මෙම පහත් බිම පෙර සරුසාර වෙල් යායක්ව පැවතුනි. මෙම ගමේ ගාලු පාරට සහ බණ්ඩාරනායක මාවතට මුහුනලා මොරටු විශ්වවිද්‍යාලය මහජන බැංකුව සහ ව්‍යාපාරික ස්ථාන රාශියක් සහ 551 ග්‍රාමය තුල පෙර පාසැල් පන්සල් දෙකක් පාසැල් දෙකක් ආයුර්වේද මධ්‍යස්ථානයක් ළමා සහ මාතෘසායනයක් සහ ලංකා ජල හසුරු ආයතනයක් ඇත.

බහු ආගමික බහු ජාතික ජන මිශ්‍රනයකින් පවතින මෙම ගමේ මුළු ජනගහනය 10671 එම ජනගහනයෙන් ස්ත්‍රී 5422 පුරුෂ 5249 යක්ද ජනවර්ගය අනුව සිංහල 10154, දෙමළ 317, බර්ගර් 73, ලංකායෝනක 96, මැලේ 21 ක් ආගම් අනුව බෞද්ධ 8933, හින්දු 237, ඉස්ලාම් 61, කතෝලික 536, ක්‍රිස්තියානි 237 වෙනත් 4ක් වයස් කාණ්ඩ අනුව අවු 1 සිට 5 දක්වා 901, අවු 6 සිට 18 දක්වා 2610, අවුරුදු 19 සිට 35 දක්වා 1696, අවුරුදු 36 සිට 60 දක්වා 3073 අවුරුදු 60 වැඩි 1172 දල වශයෙන් වාසය කරති.

මෙම ගමේ සියළු ජනයාගේ සුභ සිද්ධිය සදහා සුදානම් වෙමින් පවතින උතුරු කටුබැද්ද සණස සමිතිය 551 ග්‍රාමයේ ජනයාගෙන් 1200 වැඩි ප්‍රමාණයක් සමිතිය සමග ගිණුම් කටයුතු කරයි. ඒ අතරින් අවුරුදු 18 සිට 35 දක්වා 96ක්ද, අවුරුදු 35 සිට 50 දක්වා 160ක්ද, අවුරුදු 50 සිට 60 දක්වා 101 ක්ද, අවුරුදු 60 සිට 70 දක්වා 44 අවුරුදු 70 වැඩි 31 ක් සාමාජිකත්ව දරයි. අවුරුදු 18 අඩු ළමා සාමාජිකයන් 387ක් සහ සාමාජික නොවන 116 ගිණුම් කටයුතු කරයි.

බල ප්‍රදේශය තුල සාමාජිකත්වය විකාශනය වී ඇති ආකාරය සෙයා බැලු නිලධාරි මණ්ඩලය අඩු සාමාජිකත්ව ඇති ප්‍රදේශ සදහා 2019 වසර සදහා සාමාජිකයන් බදවා ගැනීමට උතුරු කටුබැද්ද සණස සමිතිය කොළඹ දිස්ත්‍රික් සංගමය සමග 2018 නොවැම්බර් මස 17 දින ප්‍රබෝධන වැඩ සටහනක් කල අතර උතුරු කටුබැද්ද සණස සමිතියේ සාමාජිකත්වය ලබා ගැනීම සදහා 116 දෙනෙක් අයදුම් පත් ලබාගන්නා ලදී.

උදාර වු ග්‍රාමයක පෙර ලකුණ තේමා පාඨය කරගත් උතුරු කටුබැද්ද සණස සමිතිය දරු උපතක සිට මරණය දක්වා ප්‍රතිලාභ රැසක් ලබාදෙයි දරු උපතකදී රු 3,000/- කිරි කැටි තිළිණ ලෙසද, ශිෂ්‍යත්ව සමත් දරුවන්ට රු 5,000/- තිළිනයක්ද, විවාහයකදී රු 5,000/- සිට 10,000/- දක්වා යුගදිවි තිළිණ ලෙසින්ද, අසනීප ආධාර ලෙස අසනීපයකදී රු 5,000/ ද, වකුගඩු බද්ධයකදී රු 25,000/-ක්, හත් දවසේ දානමය පිංකමකදී රු 5,000/- වියලි ආහාර මල්ලක් ලබාදෙන අතර ළමා සාමාජිකයන් සදහා ළමා චාරිකා සාහිත්‍ය තරඟ ක්‍රිකට් තරඟ, කලා වැඩසටහන්, ළමා දින සැමරීම, නොමිලයේ පොත් පත් අධ්‍යාපන ණය ලබා දෙමින් ළමා සමිතිය පෝෂනය කරති.

උතුරු කටුබැද්ද සණස සමිතිය සාමාජිකයන් සදහා සහන පොලියට එක් එක් අයට ගැලපෙන විශේෂිත වු ණය ක්‍රම හදුන්වා දී ඇත. දිගුකාලීන ණය, උපැස් ණය, දේපල ණය, භාණ්ඩ ණය, ක්ෂණික ණය, උත්සව ණය, වන්දනා ණය, අධ්‍යාපන ණය, යතුරුපැදි ණය, ව්‍යාපරික ණය, සහන ණය, සුභ සාධක ණය ක්‍රම සහ සාමාජිකයන්ට ගැලපෙන තැන්පත් ක්‍රම හදුන්වා දී ඇත.



2018 වර්ෂයේ සිට පහත සදහන් දැක්ම යටතේ ළමා සමාජය ගොඩ නැගීම උතුරු කටුබැද්ද සණස සමිතියේ අරමුණයි.

විනය සහ යහපැවැත්ම, අවබෝධය සහ ආදර්ශය, එකමුතුකම සහ අවංකත්වය, වගකීම සහ කළමණාකරණය, දැනුම සහ නිර්මාන ශීලිබව මෙම හැඩගැසීම් තුල ඉදිරියේදී සණස සමිතියේ නායකත්වය සහ තැනට සුදුසු නුවණ ඇති ළමා සමාජිකයන් බිහි කිරීම අප සමිතියේ ප්‍රධාන අරමුණයි.

උතුරු කටුබැද්ද සණස සමිතියේ දෙවැනි නායකත්වය වන තරුණ තරුණියන් සදහා කමිටු වලට එක්වීම නායකත්ව පුහුණු ක්‍රීඩා, සංස්කෘතික සහ ආගමික වැඩ සටහන්, යුග දිවි තිළිණ විවාහය සදහා ණය පහසුකම්, යතුරු පැදි ණය, නිවාස ණය, විනෝද චාරිකා, ස්වයංරැකියා ණය, වෛද්‍ය සායන පවත්වමින් දෙවැනි පෙල හැඩ ගසයි. තරුණ ඔබ අප හා එක්වී ඔබේ පැතුම් ඉටුකර ගන්නා ගමන් සණස සමිතියේ ඉදිරි නායකත්වයට පහත සදහන් දැක්ම යටතේ ඔබ සුදානම් කිරීම උතුරු කටුබැද්ද සණස සමිතියේ අරමුණයි

සමුපකාරය යනු ස්ත්‍රී පුරුෂ සාමාජිය වාර්ගික දේශපාලනික හෝ ආගමික වෙනස් කමකින් තොරව සාමාජිකයින්ගේ වගකීම් ඉටුකර ගැනීමයි.

කොළඹ දිස්ත්‍රික් සණස සංගමය මගින් වාර්ෂිකව පරීක්ෂාවට ලක්කරන කාර්‍යඵල ඇගයීමේදී උතුරු කටුබැද්ද සණස සමිතියේ කළමණාකරනය ඉහල අගයක පවතින බවත් සමිතියක සාමාජික පැවැත්ම තහවුරු කරගැනීම සදහා දරුවකුගේ උපතේ සිට ජීවිතයක අවසානය දක්වා කාල පරාසයට අයත් සාමාජිකයින් සිටින ලෙස සමිති සකස් කරගතයුතු බවත් සාර්ථකව ඉදිරියට යාම සදහා ප්‍රතිරූපයෙන් තොර ක්‍රියාවෙන් නායකයන් බිහිවිය යුතු බව සිහිතබාගෙන නායකයන් තේරීම සණස සාමාජිකයාගෙන් නිලධාරින්ගෙත් වගකීමයි. එවන් සමිතියක් සාර්ථක ගමනක් යා හැකි බව අපගේ විශ්වාසයයි.

**නිමල් කොළඹගේ - උතුරු කටුබැද්ද සණස වාර්තාකරු**



# උතුරු කටුබැද්ද සණස සමිතිය



2018 වර්ෂයේ අධ්‍යක්ෂ මන්ඩලය හා කාර්යය මණ්ඩලය

**ඉදිරිපෙළ වමේ සිට**
සභාපති ඩී.එම්. නිශ්ශංක විජේබණ්ඩාර මහතා, ප්‍රධාන කළමණාකාරිනි ගීතා ප්‍රියදර්ශණි මහත්මිය, ගිණුම් සහකාර ඩබ්.එම්. ඥානවතී මහත්මිය, කළමණාකාරිනි (ණය) ගයනා ශිරංගනී මහත්මිය, උප සභාපති නිමල් ශාන්ත කොළඹගේ මහතා

**පසුපෙල වමේ සිට**
අධ්‍යක්ෂක කේ. ඉෂාන් දනුෂ රත්නායක මහතා, අධ්‍යක්ෂක මහේන් විජේසිරි සිල්වා මහතා, ලේකම් පී.ජී. ධර්මසිරි මහතා, උපලේකම් ඩී.ඒ.එම්.ටී. අමිල සඳරුවන් අන්ද්‍රාදි මහතා, භාණ්ඩාගාරික ජේ.එල්.ඒ. දහනායක මහතා, අධ්‍යක්ෂක ගයාන් චතුරංග මහතා, අධ්‍යක්ෂක යු.ඩී. සෝමරත්න මහතා



සුභ සාධක කමිටුව

**ඉදිරිපෙල වමේ සිට**
ආර්.පී. ආරියදාස, කේ. උපසේන, අනුර සායක්කාර, කේ.සුජීව ප්‍රියජනක, ඊ. රුවන් චමින්ද, ජේ. සමන්ත පෙරේරා

**පසුපෙල වමේ සිට**
එම්. දුමින්ද පීරිස්, කේ.ඩබ්.ඒ.එස්. පත්මසිරි, නීරීක්ෂන නිලධාරි මහේන් විජේසිරි, ඒ.කේ. අරුණ ශාන්ත



අප සමිතියේ සියලු කමිටු නිලධාරින් සමඟ සාකච්ඡාවක්



අධ්‍යාපන කමිටුව

**වමේ සිට** නිමල් කොළඹගේ මහතා, පී.ජී. ධර්මසිරි මහතා, ගිහින් ජානක මහතා, මධුෂා දිලංගනී මිය, කේ.එම්.ඩි. රත්නසුරිය මහතා, නිශ්ශංක විජේබණ්ඩාර මහතා, ගයාන් චතුරංග මහතා



මහ සභාවට පැමිණි සාමාජිකයන්ගෙන් කොටසක්



ලෝක වැඩිහිටි දිනය සමරමින් කාන්තාවන් ප්‍රශ්න විසඳන ආකාරය



මනෝ විද්‍යා උපදේශිකා මුදිතා අයෝෂනී මහත්මිය වැඩසටහනක් පවත්වමින්..



කාරක සභාවේ වැඩකටයුතු කෙරෙමින්



2018 සණස සූර්ය මංගලයයේ සිඟිති අවුරුදු කුමරියන් තේරීමේ අවස්ථාව



ළමා කමිටු නිලධාරින්



උතුරු කටුබැද්ද සණස ගොඩනැගිල්ල

## උදාර වූ ග්‍රාමයක පෙර ලකුණ

**සී.ස. උතුරු කටුබැද්ද සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිතිය**

අංක 21, දේවාල පාර, කටුබැද්ද, මොරටුව.

දුරකථන : 0112 637278 ඊ-මේල් : katubeddasanasa@gmail.com

*සමානාත්මතාවයෙන් යුතුව එකට වැඩ කිරීම සමුපකාරයයි.*